සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**11 - ශ්‍රේණිය**

**පුරවැසි අධ්‍යාපනය - I, II**

**නම/විභාග අංකය : ................................................................ කාලය : පැය 01 යි.**

## පුරවැසි අධ්‍යාපනය - I

**සැලකිය යුතුයි :**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලුවක් වන්නේ,

1. සමාජ අවශ්‍යතා සමිත වීම ය.
2. බහුතර කැමැත්ත නොලැබීම ය.
3. විවිධ දේශපාලන පක්ෂ පැවතීම ය.
4. රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම ය.

02. බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රාජ්‍යයක් වන්නේ මින් කවරක් ද?

1. ඉන්දියාව
2. ඇමෙරිකාව
3. චීනය
4. බ්‍රිතාන්‍ය

03. නිදහස හා සමානාත්මතාව යන ගුණාංග සමාජය තුළ ක්‍රියාත්මකවීමට නම්,

1. යුතුකම් ඉටුකළ යුතු වේ.
2. අයිතිවාසිකම් සුරක්ෂිත විය යුතු වේ.
3. සිරිත් විරිත් රැකගත යුතු වේ.
4. පරිසර සුරක්ෂිත කළ යුතු වේ.

04. ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ,

1. නගර සභාවයි.
2. පුරවැසි සභාවයි.
3. සෙනෙට් සභාවයි.
4. උත්තර සභාවයි.

05. රාජ්‍යයක මූලික ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ආණ්ඩුව හා විධායකය.
2. පාර්ලිමේන්තුව හා රාජ්‍යය.
3. ජනගහනය හා භූමිය
4. ස්වාධිපත්‍ය හා ආගම

06. ජාතික රාජ්‍යය බිහිවීමට බලපෑ හේතුවක් නොවන්නේ,

1. පුනරුදය
2. විද්‍යාත්මතක දැනුම වර්ධනය
3. යුධ හා නාවික ශක්තිය
4. රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණය

07. දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් රටක සිටීම හේතුවෙන්,

1. පාලකයින්ට අභිමතය පරිදි ක්‍රියා කළ හැකි වේ.
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ අසර්ථකත්වය ඇති වේ.
3. නිවැරදි තීරණ ක්‍රියාත්මක කරීමට නොහැකි වේ.
4. රටේ යහපාලනයක් ගොඩ නැගීමට දායකත්වය ලබාදිය හැකි වේ.

08. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,

1. පරමාධිපත්‍ය බලය
2. පරම අධිකාරී බලය
3. ආධිපත්‍ය බලය
4. ස්වාධිපත්‍ය බලය

09. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංගයක් වන්නේ,

1. සියලු ජන කොටස් පොදු හැඟීමකින් කටයුතු කිරීම ය.
2. ලිඛිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම ය.
3. උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පවත්වා ගෙන යාම ය.
4. සියලු ජන කොටස්වලට සුභ සාධන සේවා ලබා දීම ය.

10. ඒකීය ආණ්ඩු ක්‍රම පවතින රටවල් කාණ්ඩය දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ඕස්ට්‍රේලියාව, ඇමෙරිකාව
2. ශ්‍රී ලංකාව, ස්විස්ටර්ලන්තය
3. ඇමෙරිකාව, ප්‍රංශය
4. මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය

11. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ආණ්ඩුකාරවරයාට නිල කාලය ඉකුත් වීමට පෙර ඉවත් විය හැකි ක්‍රමවේදය වන්නේ,

1. ධුරයෙන් ඉල්ලා අස්වීම.
2. අගමැතිවරයා වෙත ඉල්ලීමක් කිරීම.
3. මහ ඇමතිවරයා වෙත දැන්වීම.
4. ජනාධිපතිවරයා වෙත දැන්වීම.

12. A හා B ප්‍රකාශ සලකන්න.
A - පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරනුයේ මහා සභාවයි.
B - අප රටේ පළාත් පාලන ආයතනයක් වන මහනගර සභාවේ ප්‍රධානියා මහ ඇමතිවරයාය.

මෙම ප්‍රකාශ අතරින්,

1. A සත්‍ය වන අතර B අසත්‍යය.
2. A හා B දෙකම අසත්‍යය.
3. B සත්‍ය වන අතර B අසත්‍යය.
4. A හා B දෙකම සත්‍යය.

13. ඇමෙරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයක් ලෙස ආරම්භ වූයේ ජනපද කීයකින් ද?

1. පනහකිනි.
2. විසිනවයකිනි.
3. දහසයකිනි.
4. දහතුනකිනි.

14. සන්ධීය ආණ්ඩුවක බල අධිකාරිය බෙදී ඇති ආයතන දෙක වන්නේ,

1. ඒකීය ආණ්ඩුව හා ප්‍රාදේශීය ආණ්ඩුව
2. මධ්‍යම ආණ්ඩුව හා පළාත් ආණ්ඩුව
3. ප්‍රාදේශීය ආණ්ඩුව හා කැන්ටන්
4. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුව

15. බහු සංස්කෘතික ජන සමාජයක දැකිය හැකි ලක්ෂණයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. බහු ආගමික ජනතාවක් පමණක් එකට ජීවත් වීම.
2. එක් ජන කොටසක් තුළ වුවද ප්‍රාදේශීය විවිධත්වයක් වීම.
3. එකම භාෂාවක් කථා කරන ජනතාවක් ජීවත් වීම.
4. සිරිත් විරිත් හා විශ්වාසයන් එකම ස්වරූපයක් වීම.

16. ජන සමාජයක සංස්කෘතිය යනුවෙන් අදහස් කරනුයේ,

1. එක් ජාතියක් ලෙස කටයුතු කිරීමයි.
2. විවිධ ඇදහිලි විශ්වාසයන් සමාජය තුළ පැවතීමයි.
3. සමාජය තුළ පිළිගත් ජීවන රටාවකට හැඩගැසීමයි.
4. විවිධ කලා ශිල්ප, සිරිත් විරිත් අනුගමනය කිරීමයි.

17. ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධක වලට කරන ගෙවීම් පිළිවෙළින් ඇතුළත් වන පිළිතුර කුමක් ද?

1. වැටුප හා බදු කුලිය
2. පොලිය හා ලාභ
3. ලාභ හා පොලිය
4. බදු හා වැටුප්

18. නිෂ්පාදනයේ දී පිරිවැයක් දරණ පරිහරණයේ දී මිළක් ගෙවීමට සිදුවන භාණ්ඩ හැඳින්වෙන්නේ,

1. ආර්ථික භාණ්ඩ 2. නොමිල භාණ්ඩ
3. ආයෝජන භාණ්ඩ 4. සුබෝපභෝගී භාණ්ඩ

19. සිංගප්පූරුව හා දකුණු කොරියාව යන රටවල දැකිය හැකි වන්නේ කවර වෙළෙඳපොළ ලක්ෂණ ද?

1. සමාජවාදී 2. ධනවාදී 3. පරිවර්තන. 4. මිශ්‍ර

20. මූර්ත ජාතික නිෂ්පාදනයේ වසරින් වසර සිදුවන වැඩිවීමේ ප්‍රතිශතය,

1. සංවර්ධනයයි. 2. තිරසර සංවර්ධනයයි.
3. ආර්ථික සංවර්ධනයයි. 4. සමාජීය සංවර්ධනයයි.

21. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට සිදු ව ඇති සෘණාත්මක බලපෑමක් වන්නේ,

1. ගෝලීය වෙළෙඳපොළ පුළුල් වීම. 2. බුද්ධි ගලනය වේගවත් වීම.
3. ළදරු කර්මාන්ත දියුණු වීම. 4. වැඩ ලෝකය පුළුල් වීම.

22. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ "සන්දර්භය" තුළින් විස්තර කරන්නේ කුමක් ද?

1. පසුබිම් වන තත්ත්වයයි. 2. මනෝවිද්‍යාත්මක සාධකයි.
3. ගැටුම් හා සම්බන්ධ චර්යාවයි. 4. අසත්‍ය අවබෝධයයි.

23. ජාතික මට්ටමින් පවතින ගැටුම්කාරී තත්වයන් හැඳින්වෙන්නේ කෙසේද?

1. සූක්ෂම ගැටුම් 2. ආගමික ගැටුම්
3. සාර්ව ගැටුම් 4. අන්තර් ජාතික ගැටුම්

24. ගැටුම් නිරාකරණයේ දී මැදිහත්කරුවෙකුගේ අවධානය යොමු විය යුතු කරුණක් ලෙස සැලකිය හැක්කේ මින් කවරක් ද?

1. අපක්ෂපාතී වීමය. 2. අනම්‍ය විසඳුම් ඉදිරිපත් කිරීමය.
3. කේවල් කරන ආකාරය. 4. දෙපාර්ශවයටම බලපෑම් කිරීමය.

25. ආර්ථික තත්වය ගැටුම් මූලය වූයේ මින් කවර රාජ්‍යයක ඇති වූ ගැටුමට ද?

1. දකුණු අප්‍රිකාව 2. අයර්ලන්ත 3. සෝමාලියාව 4. මැදපෙරදිග

26. සිවිල් නීතිය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. පොලීසිය විසින් පැමිණිල්ල ඉදිරිපත් කරයි. 2. විවිධ ශාඛා දක්නට ලැබේ.
3. පුනරුත්තාපනයට ප්‍රමුඛතාව දක්වයි. 4. දේපළ රාජ සන්තක කරනු ලැබේ.

27. මුස්ලිම් නීතියට අනුව නඩු විසඳීම සඳහා පිහිටු වූ උසාවි වර්ගයක් වන්නේ,

1. රාජාධිකරණය 2. කම්කරු උසාවිය 3. කාතී උසාවිය 4. දිස්ත්‍රික් උසාවිය

28. අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා වන්නේ,

1. ජනාධිපති තුමාය. 2. අග්‍ර විනිශ්චයකාර තුමාය.
3. නීතිපති තුමාය. 4. අධිකරණ ඇමති තුමාය.

29. රටක පාලනය නීතියේ උත්තරීතර භාවයට අනුව සිදු කිරීම,

1. පරමාධිපත්‍යය යි. 2. නීතියේ ආධිපත්‍යය යි.
3. නීතියේ සාධාරණත්වය යි. 4. නීතියේ අනුකූලත්වය යි.

30. අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි ඇතුළත් පිළිතුර මින් කුමක් ද?

1. මිනීමැරුම්, දික්කසාද 2. වාණිජ කටයුතු, කාර්මික ආරවුල්
3. මිනීමැරුම්, රාජ්‍ය විරෝධී ක්‍රියා 4. ඉඩම් ආරවුල්, ළමා අපචාර

31. උප්පැන්න සහතිකයේ නම වෙනස් කර ගැනීම සඳහා කරන ඉල්ලීමක් විසඳිය හැකි අධිකරණය කුමක් ද?

1. මහාධිකරණය
2. පළාත් බද මහාධිකරණය
3. දිසා අධිකරණය
4. මහේස්ත්‍රාත් අධිකරණය

32. ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන් තනතුර ඇති කරන ලද්දේ කවර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ද?

1. 1931 ඩොනමෝර්
2. 1947 සෝල්බරි
3. 1972 පළමු ජනරජ
4. 1978 දෙවන ජනරජ

33. ඒකීය ආණ්ඩු ක්‍රමයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

1. අතිරේක ස්වාධිපති අයතන පැවතීම.
2. තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වීම.
3. උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පැවතීම.
4. මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය.

34. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ පැවති පරිපාලන කොට්ඨාසයක් ලෙස දැක්විය හැකි පිළිතුර තෝරන්න.

1. රජරට 2. දිසාව 3. දක්ඛිණදේශය 4. අටදහස් රට

35. පහත 'අ' තීරුවේ සඳහන් අධිකරණ ආයතන සමඟ 'ආ' තීරුවේඇති නඩු කටයුතු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | අ | | ආ |
|---|---|---|---|
| 1. | අභියාචනාධිකරණය | A. | තෙස්තමේන්තු නඩු |
| 2. | පළාත් බද මහා අධිකරණය | B. | මැන්ඩාමුස් ආඥා නිකුත් කිරීම |
| 3. | දිසා අධිකරණය | C. | වාණිජ ආරවුල් විසඳීම |
| 4. | මහාධිකරණය | D. | රජයේ සේවකයන් සම්බන්ධ වැරදි |
| | | E. | ශ්‍රී ලාංකිකයෙකු පිටරටක දී කරන වැරදි |

1. A B C E 2. B C A E 3. C D A B 4. D E B A

36. සේවක හා සේවකයෝජක කණ්ඩායම් අතර ඇතිවන වෘත්තීය ආරවුල් නීතිමය රාමුවක් තුළ විසඳා ගැනීම,

1. සමථකරණයයි.
2. කේවල් කිරීමයි.
3. බේරුම්කරණයයි.
4. මැදිහත්කරණයයි.

37. යටත් විජිත පාලන සමය තුළ ශ්‍රී ලාංකිකයින්ට දේශපාලන මැදිහත් වීමට වැඩි අවස්ථාවක් ලබා දුන් ආණ්ඩු ක්‍රමය කුමක් ද?

1. කෲව්මැකලම්
2. මැනිං
3. මැනිං - ඩෙවෝන්ෂයර්
4. ඩොනමෝර්

38. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතුවක් වන්නේ,

1. සංවර්ධන කටයුතු සඳහා මුදල් ලබා ගැනීම.
2. ප්‍රාදේශීය පරිපාලනමය ගැටලු ඇති කිරීම.
3. ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරීම.
4. ජනතා සහභාගීත්වය අවම කර ගැනීම.

39. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකය සතු කාර්යයක් වන්නේ,

1. පුරවැසි අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම.
2. නීතිය ක්‍රියාත්මක කිරීම.
3. යුක්තිය පසඳලීම.
4. නීති සම්පාදනය කිරීම.

40. මහා මැතිවරණයකින් පසු තේරී පත්වන පාර්ලිමේන්තුවේ ප්‍රථම කාර්යය වන්නේ මින් කවරක් ද?

1. කථානායකවරයකු පත්කර ගැනීම.
2. අගමැතිවරයෙකු පත්කර ගැනීම.
3. මහජන දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම.
4. අනාගත පාලකයින් පුහුණු කර ගැනීම.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**11 - ශ්‍රේණිය**

**පුරවැසි අධ්‍යාපනය - II**

**නම/විභාග අංකය : ..............................................................** **කාලය : පැය 02 යි.**

## පුරවැසි අධ්‍යාපනය - II

**සැලකිය යුතුයි :**

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. i. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
    ii. ආණ්ඩුව සමන්විත වන ආයතනවලින් දෙකක් නම් කරන්න.
    iii. දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුමට අයත් රටවල් දෙකක් සඳහන් කරන්න.
    iv. ස්විස්ටර්ලන්තයේ සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න.
    v. ධනවාදී ආර්ථිකයක ලක්ෂණ දෙකක් ලියන්න.
    vi. ගැටුම් නිරාකරණය සඳහා භාවිතා කරන සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ දෙකක් ලියන්න.
    vii. නීතියේ මූලාශ්‍ර දෙකක් නම් කරන්න.
    viii. නීතිපතිතුමාගේ කාර්යයන් ඉටු කිරීම සඳහා සහාය වන නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න.
    ix. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග දෙකක් සඳහන් කරන්න.
    x. පළාත් පාලන ආයතනයකින් ඉටුකරනු ලබන පොදු උපයෝගිතා සේවාවන් දෙකක් ලියන්න.

(ලකුණු 2×10=20)

02. අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියා සතු වගකීමකි.

    i. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියා සතු යුතුකම් බෙදිය හැකි වර්ග දෙක සඳහන් කරන්න. (ලකුණු 02)
    ii. රාජ්‍යයකින් පුරවැසියකු කෙරෙහි ඉටුවිය යුතු වගකීම් තුනක් ලියන්න. (ලකුණු 03)
    iii. A - ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග තුනක් ලියන්න.
    B - ඉන් එක් ගුනාංගයක් සමාජයේ සංවර්ධනයට හේතුවන ආකාරය පැහැදිළි කරන්න. (ලකුණු 05)

03. ''සන්ධීය ආණ්ඩු විවිධත්වය තුළින් ඒකීයත්වය ඇති කරයි.''

    i. සන්ධීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)
    ii. ස්විස්ටර්ලන්ත ආණ්ඩු ක්‍රමයේ කැන්ටන් සතු බලතල තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
    iii. A - ස්විස්ටර්ලන්ත සන්ධීය රාජ්‍යය තුළ භාවිතා වන නිල භාෂා තුනක් ද ,
    B - සන්ධීය මහා මණ්ඩලය සමන්විත ආයතන දෙක ද, සඳහන් කරන්න. (ලකුණු 05)

04. "මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීමට විවිධ භාණ්ඩ හා සේවා උපයෝගී කර ගනියි."

i. නිෂ්පාදන සාධක වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව බෙදිය හැකි වර්ග තුන සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ඔබ නොමිලේ ලබා ගන්නා භාණ්ඩයක් වුවද සඳහර විටෙක ආර්ථික භාණ්ඩයක් විය හැකිය. නිදසුන් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 03)

05. ''පවතින නීතියට හා අධිකරණයට ගරු කරමින් කටයුතු කිරීම පුරවැසි යුතුකමකි.''

i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉහළම අධිකරණ ආයතන දෙක පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

ii. නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii. A - අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය ඉටු නොවීමෙන් ඇති විය හැකි අයහපත් තත්ත්වයන් තුනක් සඳහන් කරන්න.
B - ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. ''බලය විමධ්‍යගත වීම පාලනය පහසු කරයි. ''

i. පළාත් පාලන ක්‍රමයෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් පිහිටු වූ මහ නගර සභා තුන නම් කරන්න. (ලකුණු 03)

iii. A - ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු තුනක් සඳහන් කරන්න.
B - ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. ''ශ්‍රී ලංකා ආර්ථිකය තුළ විවිධ සංවර්ධන ප්‍රයත්නයන් ක්‍රියාත්මක වේ.''

i. ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. මෑත කාලීන සංවර්ධන ක්‍රියා තුළින් ශ්‍රී ලංකාව ආර්ථිකයට අත්වන වාසි තුනක් ලියන්න.(ලකුණු 03)

iii. මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු කර ඇති නව වෙනස්කම් තුනක් සඳහන් කරන්න.
ඉන් එකකින් ලබා ගත හැකි ප්‍රයෝජන පිළිබඳ ඔබගේ අදහස කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 05)

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය

## 11 ශ්‍රේණිය - පිළිතුරු

## පුරවැසි අධ්‍යාපනය - I

| | | | |
|---|---|---|---|
| 01 - 4 | 11 - 1 | 21 - 2 | 31 - 3 |
| 02 - 1 | 12 - 1 | 22 - 1 | 32 - 4 |
| 03 - 2 | 13 - 4 | 23 - 3 | 33 - 4 |
| 04 - 2 | 14 - 4 | 24 - 1 | 34 - 2 |
| 05 - 3 | 15 - 2 | 25 - 4 | 35 - 1 |
| 06 - 3 | 16 - 3 | 26 - 2 | 36 - 3 |
| 07 - 4 | 17 - 2 | 27 - 3 | 37 - 4 |
| 08 - 1 | 18 - 1 | 28 - 2 | 38 - 3 |
| 09 - 1 | 19 - 2 | 29 - 2 | 39 - 4 |
| 10 - 4 | 20 - 3 | 30 - 3 | 40 - 1 |

(ලකුණු 1×40=40)

## පුරවැසි අධ්‍යාපනය - II

01. i පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම, අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා වීම, මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම, .................... ආදිය

ii. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය

iii. ශ්‍රී ලංකාව, ඉන්දියාව, නේපාලය, පකිස්ථානය, බංගලාදේශය, භූතානය, මාලදිවයින

iv. ජාතික ආරක්ෂාවට තර්ජන එල්ල වීම, දැඩි භූගෝලීය විෂමතා, වාර්ගික, ආගමික, භාෂා විවිධත්වය

v. තරඟකාරී වෙළෙඳපොළක් පැවතීම, නිෂ්පාදන සාධක අයිතිය පෞද්ගලික අංශය සතු වීම, ලාභය අරමුණු කර ගෙන නිෂ්පාදනය, ආදායම් බෙදී යාමේ අසමානතා ............

vi. සාකච්ඡාවෙන් විසඳුම් කරා යොමු වීම, ක්ෂණික විසඳුම් ලැබීම, දෙපාර්ශවයටම ජය, ජය විසඳුම් ලැබීම, වියදම් අවම ක්‍රමයක් වීම.

vii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, විවිධ අණපනත්, අධිකරණ තීන්දු, සිරිත් විරිත්, ආගම .........

viii. සොලිස්ටර් ජනරාල්, අතිරේක සොලිස්ටර් ජනරාල්, රජයේ ජ්‍යේෂ්ඨ අධිනීතිඥවරුන්, රජයේ අධිනීතිඥවරුන්

ix. මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා

x. පොදු ස්ථානවලට විදුලි ආලෝකය ලබා දීම, පොදු කියවීම් ශාලා පවත්වා ගෙන යාම..................

(ලකුණු 2ඃ10=20)

02.

i. නීතිමය යුතුකම්, සදාචාරාත්මක යුතුකම් (ලකුණු 02)

ii. නීතිය හා සාමය ආරක්ෂා කිරීම, සමානාත්මතාව ආරක්ෂා කිරීම, පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම ............. (ලකුණු 03)

iii. A - විරුද්ධ මත ඉවසීම, සයයෝගයෙන් කටයුතු කිරීම, බහුතර මතයට ගරු කිරීම .............. ආදිය
B - සිසු පිළිතුරු ගැලපේ නම් ලකුණු දෙන්න. (ලකුණු 2+3=05)

03.

i. පරිපාලන තීන්දු ගැනීම පහසු වීම, ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම, රාජ්‍යයන් අත්තනෝමතිකව ක්‍රියා කිරීම වැළැක් වීම ........................ (ලකුණු 02)

ii. අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය, පුවත්පත් පාලනය, මහා මාර්ග, කර්මාන්ත, ආගමන, බැංකු කටයුතු, බෝවන රෝග වැළැක්වීම .......... (ලකුණු 03)

iii. A - ස්විස්ටර්ලන්තය, ජර්මන්, ප්‍රංශ, රොමාන්ෂ්, ඉතාලි
B - ජාතික සභාව හා රාජ්‍ය සභාව (ලකුණු 2+3=05)

04.

i. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය (ලකුණු 02)

ii. පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ (ලකුණු 03)

iii. ජලය, වාතය, හිරු එළිය, ආදිය.. ආර්ථික භාණ්ඩ වන අවස්ථා පිළිබඳ කෙටි විස්තරයකට ලකුණු දෙන්න. (ලකුණු 05)

05.

i. ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය (ලකුණු 02)

ii. ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම, සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිදලීම, නීතිය ඉදිරියේ සැම දෙනාම සමාන වීම, නීතිය නොදැන සිටීම, නිදහසට කරුණක් ලෙස නොසැලකීම ........... (ලකුණු 03)

iii. නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම, යුක්තිය ඉටු කර ගැනීමට අනියම් ක්‍රම භාවිතය, අපරාධ හා දූෂණ ඉහළ යාම, අධිකරණයට හා නීතියට ඇති ගෞරවය හීන වීම ............ (ලකුණු 03+02)

06.

i. පාලනය ජනතාව සම්බන්ධ කර ගැනීම, ප්‍රාදේශීය ජනතා අවශ්‍යතා මත මධ්‍යම ආණ්ඩුවේ ප්‍රතිපත්ති සකස් කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම, ප්‍රජා අවශ්‍යතා කඩිනමින් ඉටු කරලීම ......... අදිය (ලකුණු 02)

ii. කොළඹ, මහනුවර, ගාල්ල (ලකුණු 03)

iii. සම්පත් බෙදී යාමේ විෂමතා නිසා ඇතිවන තත්වයන්, ජනතා දැනුම ප්‍රමාණවත් නොවීම, පළාත් සභා වලට හා පළාත් පාලන ආයතනවලට ප්‍රමාණවත් බලය නොමැති වීම, මධ්‍යම ආණ්ඩුව හා ප්‍රදේශීය ඒකක අතර ගැටලු .......... ආදිය (ලකුණු 05)

07.

i. මග නැගුම, ගම නැගුම, ගමකට එක් වැඩක්, නිවාස ව්‍යාපෘති ........ ආදි සිසුන් ඉදිරිපත් කිරීම් අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

ii. සේවා නියුක්තිය ඉහළ යාම, ජීවන මට්ටම උසස් වීම, යටිතල පහසුකම් වර්ධනය, නව රැකියා වෙළෙඳපොළ පුළුල් වීම, ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම ............. ආදිය (ලකුණු 03)

iii. උසස් පෙළට නව විෂයධාරා හඳුන්වා දීම, තාක්ෂණික විද්‍යාගාර, වෘත්තීය විශ්ව විද්‍යාල, සපිරි පාසල් දහසක් ඇති කිරීම, පාසල් නිල ඇඳුම්, පෙළ පොත් ලබා දීම ආදිය - සිසු පිළිතුර අනුව ලකුණු දෙන්න. (ලකුණු 03+02)

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**
**Learn Ordinary Level**

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371




# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

# PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්ව ගන්න
# ඔන්ලයින් ඔඩර් කරන්න
# WWW.LOL.LK
# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE



An evening of fun for young readers